සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

GIT | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය ............................ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I කාලය පැය එකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. පහත සඳහන් සංරචක අතුරින් පරිගණක පද්ධතියක ප්‍රධාන සංරචකයක් ලෙස හඳුනාගත **නොහැකි** සංරචකය කුමක්ද?
   1. ජීවාංග 2. දෘඩාංග 3. මෘදුකාංග 4. මෙහෙයුම් පද්ධතිය

2. නිමල් හට ඔහු විසින් සකස් කරන ලද ලේඛනයකට මුද්‍රිත පොතක ඇති පින්තූරයක් ඇතුලත් කිරීමට අවශ්‍ය වී ඇත. මේ සඳහා ඔහුට භාවිතා කළ හැකි සුදුසුම ආදාන උපාංගය කුමක්ද?
   1. සුපිරික්සකය 2. ආලෝක පෑන 3. ප්‍රකාශ සලකුණු සංජානනය 4. මූසිකය

3. මූලික බූලීය කාරකයක් ලෙස සැලකිය හැක්කේ ,
   1. AND 2. NOR 3. XOR 4. NAND

4. 123 යන දශමය සංඛ්‍යාවට තුල්‍ය ද්විමය සංඛ්‍යාව කුමක් ද?
   1. $01011011_2$ 2. $01111001_2$ 3. $01111011_2$ 4. $01011010_2$

5. අදාන උපාංග මගින් ලබාදෙන දත්ත හා උපදෙස් ................... හරහා මුළින්ම ගමන් කරනු ලැබේ.
   1. පඨන මාත්‍ර මතකය 2. සසම්භාවී පිවිසුම් මතකය
   3. වාරක මතකය 4. මතක රෙජිස්තරය

6. පහත සඳහන් මෘදුකාංග අතරින් මෙහෙයුම් පද්ධතියක් ලෙස සැලකිය **නොහැකි** මෘදුකාංගය වනුයේ?
   1. Mac OS 2. Windows XP 3. MS Access 4. Ubuntu

7. $10111010_2$ යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය දශමය සංඛ්‍යාව කුමක් ද?
   1. 186 2. 188 3. 158 4. 185

8. පහත සඳහන් දෑ අතරින් දත්ත ලෙස පමණක් වර්ගීකරණය කළ හැකි පිළිතුරු තෝරන්න.
   a) රටක ආර්ථික වර්ධන වේගය b) අනුලක්ෂණ, දෘෂ්‍ය හා ශබ්ධ
   c) ගණිතය විෂයට ලබාගත් ලකුණු 30 d) රටක ඇති නගර ගණන
   1. b හා c 2. b,c හා d 3. c හා d 4. a,b,c,d සියල්ලම

9. පාරිභෝගිකයෙකු විසින් මිලදී ගැනීම සඳහා තෝරා ගන්නා ලද භාණ්ඩ අයකැමියා වෙත ලබා දුන් පසු, අයකැමියා විසින් එම එක් එක් භාණ්ඩයේ මිල සහ ප්‍රමාණය පරිගණක පද්ධතියට ඇතුළත් කළ පසු එයට අදාළ බිල පරිගණක තිරයේ දිස්වේ. ඉහත සිද්ධියට අදාළ ආදාන, ක්‍රියාවලිය හා ප්‍රතිදානය නිවැරදිව පිළිවෙළට දක්වා ඇති පිළිතුර තෝරන්න.
   1. බිල සකස් කිරීම, මිල ගණන් හා ප්‍රමාණ ඇතුලත් කිරීම, මිල දර්ශනය වීම.
   2. මිල ගණන් හා ප්‍රමාණය ඇතුළත් කිරීම, බිල පරිගණක තිරයේ දර්ශනය වීම, බිල සකස් කිරීම.
   3. භාණ්ඩ ප්‍රමාණය ඇතුලත් කිරීම, මිල දර්ශනය වීම, බිල සකස් කිරීම.
   4. භාණ්ඩ හා ප්‍රමාණය ඇතුළත් කිරීම, බිල සකස් කිරීම, බිල පරිගණක තිරයේ දර්ශනය වීම.

10. පාදක වටිනාකම 5 වන සංඛ්‍යා පද්ධතියක භාවිතා වන සංඛ්‍යාංක ගණන කීයද?
1. 4 2. 5 3. 6 4. 8

11. තොරතුරක වටිනාකම සහ ගුණාත්මකභාවය සඳහා **බලනොපාන** සාධකය කුමක්ද?
1. අදාළත්වය 2. කාලානුරූපී නොවීම 3. සම්පූර්ණත්වය 4. නිරවද්‍යතාවය

12. PS/2 කෙවෙනිය මගින් පරිගණක පද්ධතියකට සම්බන්ධ කරනු ලබන උපාංගයක් පහත සඳහන් පිළිතුරු අතරින් තෝරන්න.
1. මූසිකය 2. මුද්‍රණ යන්ත්‍රය 3. මාර්ගකය 4. බහු මාධ්‍ය ප්‍රක්ෂේපකය

13. ...................................................... පරිගණකයක් මිල දී ගැනීමේ දී සැලකිලිමත් වන දෘඩාංග පිරිවිතරයක් නොවේ.
1. සකසනයේ වේගය 2. ප්‍රධාන මතක ධාරිතාව
3. පරිගණක තිරයේ විභේදනය 4. මෙහෙයුම් පද්ධති

14. $2AE_{16}$ වන ෂඩ් දශමය සංඛ්‍යාවේ A සඛ්‍යාංකය මගින් නිරූපිත වටිනාකම කීයද?
1. 01 2. 10 3. 64 4. 160

15. සමර්පණ මෘදුකාංගයක නව කදාවක් ලබා ගැනීම සඳහා අදාල කෙටි මං යතුර කවරක් ද?
1. Ctrl +N 2. Ctrl + M 3. Ctrl + S 4 Ctrl + F

16. වදන් සැකසුම් මෘදුකාංගයකින් සැකසූ ගොනුවක ගොනු දිගුවක් විය **නොහැක්කේ,**
1. .docx 2. .ppt 3. .doc 4. .odt

17. පහත මෘදුකාංග අතරින් උපයෝගීතා මෘදුකාංගයක් ලෙස සැලකෙන මෘදුකාංගය සඳහන් කරන්න.
1. වදන් සැකසුම් මෘදුකාංග 2. ප්‍රතිවෛයිරස මෘදුකාංග
2. වෙබ් අතරික්සුව 4. සමර්පණ මෘදුකාංග

18. නිහිත මෙහෙයුම් පද්ධති භාවිතා **නොවන** උපාංගයක් සඳහන් වන වරණය කුමක්ද?
1. ඩ්‍රෝන කැමරා 2. සුහුරු අත් ඔරලෝසු
3. ජංගම දුරකථන 4. උකුළු පරිගණක

19. ඇස්කි කේත ක්‍රමයේදී A අක්ෂරයෙහි දශමය අගය 65 මගින් නිරූපණය වන්නේ නම් E අක්ෂරයෙහි ඇස්කි අගය වනුයේ?
1. 01000001 2. 01000000 3. 01000101 4. 01000100

20. වින්ඩෝස් මෙහෙයුම් පද්ධතියක් යටතේ ක්‍රියාත්මක වැඩසටහන් වල ඇති පාඨ හා චිත්‍රක වෙනත් ස්ථානයකට ගෙන යාම(Move) සිදු කළ හැක්කේ කෙසේද?
1. කැපීම (cut) හා ඇලවීම (paste) 2. කැපීම (cut) හා පිටපත් කිරීම (copy)
3. මකා දැමීම (delete) හා ගෙනයාම (move) 3. පිටපත් කිරීම (copy) හා ඇලවීම (paste)

21. X=A.B+B Y= $\overline{(A+B)}$ + A
A=1 හා B=0 නම් X හා Y අගයන් පිළිවෙලින් දැක්වෙන වරණය කුමක්ද?
1. 0 හා 0 2. 0 හා 1 3. 1 හා 0 4. 1 හා 1

22. පහත ප්‍රකාශ සලකන්න.
A. වෛරස වලට එරෙහිව දත්ත සුරැකීම
B. තැටි ධාවක හා පර්යන්ත උපාංග පාලනය
C. මිත්‍රශීලී අතුරු මුහුණතක් සැපයීම
මෙම ප්‍රකාශ අතුරින් මෙහෙයුම් පද්ධතියක කාර්යය/ කාර්යයන් නිරූපණය වන පිළිතුර තෝරන්න.
1. A පමණි 2. B පමණි 3. A හා B පමණි 4. A,B හා C සියල්ලම

23. ලබා දී ඇති සත්‍යතා වගුව මගින් නිරූපණය වන ද්වාරය කුමක්ද?

| A | B | F |
|---|---|---|
| 0 | 0 | 0 |
| 0 | 1 | 1 |
| 1 | 0 | 1 |
| 1 | 1 | 1 |

1. OR ද්වාරය 2. AND ද්වාරය
3. NOT ද්වාරය 4. NAND ද්වාරය

24. චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක් සහිත මෙහෙයුම් පද්ධතියක ලක්ෂණයක් **නොවන්නේ,**
1. මිත්‍රශීලී අතුරුමුහුණතකි 2. විධාන යතුරු ලියනය කළ යුතුය.
3. කවුළු හා අයිකන දැකගත හැකිය 4. භාවිතය පහසුය

25. පරිගණක තිරයේ දර්ශණය වන දෑ හි පින්තූරයක් (image) ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි මෙවලමක් වන්නේ?
1. Snipping tool 2. Sound recorder 3. Character Map 4. On screen keyboard

26. මෘදුකාංග වර්ගීකරණය අනුව වදන් සැකසුම් මෘදුකාංග පහත සඳහන් කුමන මෘදුකාංග වර්ගයට අයත් වන්නේ ද?
1. යෙදුම් 2. උපයෝගිතා 3. භාෂා පරිවර්තක 4. පද්ධති

27. වදන් සැකසුම් මෘදුකාංග සඳහා නිදසුනක් **නොවන්නේ,**
1. Microsoft Office word 2. OpenOffice Writer
3. LibreOffice Writer 4. OpenOffice Calc

28. යුනිකේත ක්‍රමයේ අනුලක්ෂණයක් නිරූපණය සඳහා භාවිතා වන බිටු ගණන කීයද?
1. 4 2. 7 3. 8 4. 16

29. 010110, 011110, 010011 යන ද්විමය සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට සකස් කළ විට නිවැරදි පිළිතුර තෝරන්න.
1. 010110, 011110, 010011 2. 010011, 011110, 010110
3. 010011, 010110, 011110 4. 011110, 010110, 010011

30. ලොප් (Undo) කිරීම සඳහා අවශ්‍ය වන කෙටි මං යතුර සඳහන් වරණය කුමක්ද?
1. Ctrl + Y 2. Ctrl + Z 3. Ctrl + V 4. Ctrl + X

31. ඉලෙක්ට්‍රොනික පැතුරුම්පතක පේලියක් හා තීරුවක් ඡේදනය වී .......................... නිර්මාණය වේ.
1. තීරුවක් 2. පේළියක් 3. කෝෂයක් 4. සූත්‍රයක්

32. පැතුරුම්පත් මෘදුකාංග වල ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන පහත සමීකරණ අතරින් **වැරදි** සූත්‍රය වනුයේ?
1. =Average (A1:B2) 2. =Sum(A1:B2)
3. =Max(A1:B2,A3) 4. =Sum(A1;B3)

33. එක් වර්ණ පික්සලයක් බිටු අටකින් සමන්විත වේ නම්, RGB වර්ණ පික්සලයක් සමන්විත වන බිටු ගණන කීයද?
1. 24 2. 8 3. 3 4. 1024

34. තේ, පොල් හා රබර් අපනයනය කරන වෙළඳ ආයතනයක පසුගිය වර්ෂයේ මුළු ආදායම එක් එක් අපනයන බෝගයේ ප්‍රතිශතයක් ලෙස නිරූපණයට වඩාත් සුදුසු ප්‍රස්ථාර වර්ගය කුමක්ද?
1. තීරු (Column) 2. දඬු (Bar) 3. රේඛා (Line) 4. වට (Pie)

35. කදා අතර මාරු වීමේ දී ඒ සඳහා චලන රටාවක් ලබා දීමට භාවිතා වන පහසුකම කුමක්ද?
1. කදා පිරිසැලසුම (Slide Layout) 2. කදා සැලසුම (Slide Design)
3. කදා සංක්‍රාන්තිය (Slide Transition) 4. සජීවීකරණ (Animation)

- **පහත දත්ත සමුදාය වගුව ඇසුරින් 36 හා 37 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| ItemID | I_Name | Stock |
|---|---|---|
| 1001 | Book | 25 |
| 1002 | File | 10 |

36. ඉහත වගුවේ අඩංගු ක්ෂේත්‍ර හා රෙකෝඩ ගණන පිළිවෙළින් සඳහන් පිළිතුර තෝරන්න.
    1. 2,3  2. 3,2  3. 3,3  4. 2,4

37. Stock ක්ෂේත්‍රය සඳහා භාවිතා කළ හැකි දත්ත ප්‍රරූපය කවරේද?
    1. පාඨ (Text)  2. සංඛ්‍යා (Number)
    3. බූලියන් (Boolean)  4. මුදල් (Currency)

38. වගුවකට නව රෙකෝඩ ඇතුලත් කිරීමට හා පවතින රෙකෝඩ වෙන් වෙන් වශයෙන් දර්ශනය කර ගැනීමට භාවිතා වන්නේ
    1. වගු (Table)  2. විමසුම් (Query)  3. ආකෘති පත්‍ර (Form)  4. වාර්තා (Report)

39. .......................... වර්ණය CMYK වර්ණ ප්‍රභේදයට අයත් වර්ණයක් නොවේ.
    1. කහ  2. කළු  3. කොළ  4. දම්

40. පහත දැක්වෙන යෙදුම් මෘදුකාංග අතරින් වීඩියෝ සංස්කරණය සඳහා භාවිතා කළ හැකි මෘදුකාංගය කුමක්ද?
    1. Audacity  2. Power Sound Editor
    3. Adobe Photoshop  4. Windows Movie Maker

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| GIT | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................


සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II

කාලය පැය දෙකයි

වැදගත්

ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. පරිගණකයක සමස්ත ක්‍රියාවලිය පාලනය කිරීම සඳහා භාවිතා කරන මෘදුකාංගය මෙහෙයුම් පද්ධතියයි. පහත දැක්වෙනුයේ සුරක්ෂිත කර ලද ගොනුවක විස්තර දැක්වෙන රූප සටහනකි.




a. ඉහත සඳහන් ගොනුවේ ගොනු නාමය සහ ගොනු දිගුව ලියා දක්වන්න. (ල: 02)

b. එම ගොනුව සකස් කිරීමට යොදාගෙන ඇති මෘදුකාංගය කුමක්ද?(ල: 02)

c. එම ගොනුව ඉහත සුරක්ෂිත කරන ලද ස්ථානයෙන් ඉවත් කර Computer හි D: ධාවකය තුළ My School නම් ගොනු බහාලුමක් (Folder)නිර්මාණය කර එය තුළට විතැන් (Move) කිරීමට අවශ්‍යව ඇත. ඒ සඳහා අනුගමනය කළ යුතු පියවර ලියා දක්වන්න. (ල: 02)

d. මෙහෙයුම් පද්ධතියක මෙවලම් ලෙස සැලකෙන උපයෝගිතා මෘදුකාංග දෙකක් නම් කරන්න. (ල: 02)

e. මෙහෙයුම් පද්ධතියක දැකගත හැකි අතුරුමුහුණත් වර්ග දෙකක් ලියන්න. (ල: 02)

f. ඔබ ඉහත සඳහන් කල අතුරුමුහුණත් දෙකෙහි එක් වෙනස්කමක් සඳහන් කරන්න. (ල: 02)

02. a. පහත දැක්වෙන්නේ වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් සකස් කරන ලද දැන්වීමකි.එහි A සිට E දක්වා ලේබල කර ඇති දෑ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. A ලෙස දක්වා ඇති මාතෘකාවේ පෙනුම එලෙස ලබා ගැනීමට සිදු කළ යුතු වෙනස්කම් (Text Formatting) මොනවාද?

ii. B ලෙස ලැයිස්තුවක් ලබා ගැනීමට අවශ්‍ය මෙවලම කුමක්ද?

iii. C ලෙස දක්වා ඇති ඡේදයේ එකෙල්ලෙ (Align) කිරීමේ ක්‍රමය කුමක්ද?

iv. D ලෙස ලේබල් කර ඇති වචනය යටින් රතු පැහැ ඉරක් ඇඳී ඇත. එයට හේතුව කුමක්ද? එය නිවැරදි කරගැනීමට භාවිතා කළ හැකි මෙවලම කුමක්ද?

v. E ලෙස දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනය ඇතුලත් කිරීමට භාවිතා වන මෙවලම කුමක්ද?

(ල.01x5= 05)

b. පහත දැක්වෙන්නේ වදන් සැකසුම් මෘදුකාංගයක භාවිතා වන විධාන සහ මෙවලම් කිහිපයකි. ඒවා මගින් සිදුකර ගතහැකි කාර්යය කෙටියෙන් ලියා දක්වන්න.

i. UNDO ii. COPY iii. FIND iv. SORT v. CHANGE CASE (ලකුණු 05)

c. පහත දැක්වෙන කෙටිමං යතුරු භාවිතයෙන් සිදුකරගත හැකි කාර්යය කුමක්ද?

i. Ctrl + P ii. Ctrl + N (ලකුණු 02)

03. පහත දක්වා ඇත්තේ "සුමිතුරෝ"ගොවි සමාජයේ සාමාජිකයෙක් 2019 අවසාන මාස හය තුළ බෝතල් කර විකුණන ලද ආහාර ද්‍රව්‍ය පිළිබඳ දත්ත ඇතුලත් පැතුරුම්පතක කොටසකි. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E | F | G | H |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | මිල ගණන් | | | | | | | |
| 2 | වර්ගය | බෝතලයක මිල (රුපියල්) | | | | | | |
| 3 | චිලි පේස්ට් | 130 | | | | | | |
| 4 | අඹ චට්නි | 165 | | | | | | |
| 5 | ජෑම් | 240 | | | | | | |
| 6 | | | | | | | | |
| 7 | විකුණුම් වාර්තාව | | | | | | | |
| 8 | මාසය | චිලි පේස්ට් | ආදායම | අඹ චට්නි | ආදායම | ජෑම් | ආදායම | |
| 9 | ජනවාරි | 350 | | 175 | | 400 | | |
| 10 | පෙබරවාරි | 400 | | 200 | | 405 | | |
| 11 | මාර්තු | 450 | | 250 | | 475 | | |
| 12 | අප්‍රේල් | 500 | | 340 | | 510 | | |
| 13 | මැයි | 250 | | 150 | | 300 | | |
| 14 | ජුනි | 340 | | 140 | | 325 | | |
| 15 | මුළු ආදායම | | | | | | | |
| 16 | වැඩිම ආදායම | | | | | | | |
| 17 | අඩුම ආදායම | | | | | | | |
| 18 | සාමාන්‍ය ආදායම | | | | | | | |

i. මෙහි B2 කෝෂයේ "බෝතලයක මිල රුපියල්" යන්න පේළි කිහිපයක පිහිටන සේ සකස් කිරීමට භාවිත කර ඇති මෙවලම නම් කරන්න. (ලකුණු 01 )

ii. ජනවාරි මාසය තුළ චිලි පේස්ට් අලෙවියෙන් ලද ආදායම C9 කෝෂයට ලබා ගැනීමට භාවිත කළහැකි සූත්‍රය ලියන්න. ( ජනවාරි මාසයේ ආදායම ඇසුරින් අනෙකුත් මාස සඳහාද ආදායම ගණනය කරන බව සලකන්න.) (ලකුණු 02 )

iii. ඉහත සූත්‍රය ඇසුරින් අනෙකුත් මාසවල ආදායම ගණනය කිරිම සඳහා අනුගමනය කරන පියවර ලියා දක්වන්න. (ලකුණු 02)

iv. මාස හය තුළ අඹ චට්නි ආදායමෙන් ලද මුළු ආදායම E15 කෝෂයට ලබා ගැනීමට භාවිත කළ හැකි =function(cell 1 :cell 2) ආකාරයේ සූත්‍රයක් ශ්‍රිත භාවිතයෙන් ලියන්න. (ලකුණු 01)

v. චිලි පේස්ට් අලෙවියෙන් ලද වැඩිම ආදායම C16 කෝෂයට ලබා ගැනීමට භාවිත කළ හැකි =function2(cell 3:cell 4) ආකාරයේ සූත්‍රයක් ශ්‍රිත භාවිතයෙන් ලියන්න. (ලකුණු 02)

vi. ජෑම් බෝතල් අලෙවියෙන් ලද අඩුම ආදායම G17කෝෂයට ලබා ගැනීමට භාවිත කළ හැකි ආකාරයේ සූත්‍රයක් ශ්‍රිත භාවිතයෙන් ලියන්න. (ලකුණු 02)

vii. බෝතල් කරන ලද ආහාර වර්ග තුන අලෙවියෙන් මාසයක් තුළ ලද සාමාන්‍ය ආදායම C18 කෝෂයට ලබා ගැනිමට භාවිත කළ යුතු සූත්‍රය =function 4(cell 8 :cell 9, cell 10 : cell 11, cell 12 : cell 13) මගින් ලියා දක්වන්න. (ලකුණු 02)

04. ඔබ පාසලේ පුස්තකාලාධිපති විසින් පුස්තකාලයේ ඇති පොත් පිළිබඳවත්, සාමාජිකයින් පිළිබඳවත්, පිටතට නිකුත්කරන පොත් පිලිබඳවත් තොරතුරු තබාගැනීම සඳහා පහත ආකාරයේ දත්ත සමුදායක් පවත්වාගෙන යයි.

පොත් වගුව

| Book_ID | Book_Name | Author_Name |
|---|---|---|
| 3405 | Madol Doova | Mr. Martin Wickramasinghe |
| 3406 | Hath Pana | Mr. Kumarathunga Munidasa |
| 3407 | AmbaYahaluwo | Mr. T.B.Ilangarathna |

ශිෂ්‍ය වගුව

| St_ID | St_Name | Grade |
|---|---|---|
| S01 | Sanka | 6 |
| S02 | Hasitha | 8 |
| S03 | Kumudu | 7 |

බැහැරගෙන යාම් වගුව

| St_ID | Book_ID | Borrowed_Date | Lend_Date |
|---|---|---|---|
| S02 | 3405 | 2020/02/02 | 2020/02/10 |
| S01 | 3407 | 2020/02/15 | |

a. ප්‍රාථමික යතුරු දෙකක් අදාළ වගුවල නම් සමඟ ලියන්න. (ල:02)

b. ආගන්තුක යතුරක් අදාළ වගුවේ නම සමඟ ලියා දක්වන්න. (ල: 02)


c. 8 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සෙව්වන්දි ශිෂ්‍යාව 2020/02/18 වන දින පුස්තකාලයේ සාමාජිකත්වය ලබා එදිනම මඩොල් දූව පොත බැහැර ගෙන යන ලදී.
   - a) මෙහිදී කුමන වගුව/වගු යාවත්කාලීන කළ යුතුද? (ල: 02)
   - b) ඉහත යාවත්කාලීන කිරීම් අදාල වගුවේ නම සමඟ ලියා දක්වන්න. (ල: 04)

d. මේ වන විට පුස්තකාලයට නැවත භාර නොදුන් පොත්වල , පොතේ නම, කතෘ, පොත බැහැර ගෙන ගිය ශිෂ්‍යාගේ නම, ශ්‍රේණිය,බැහැර ගෙන ගිය දිනය යන තොරතුරු ඔබට එකම වගුවක පෙන්වීමට අවශ්‍ය නම් ඒ සඳහා ඔබ භාවිතා කරන දත්ත සමුදාය මෘදුකාංගයක ඇති පහසුකම කුමක්ද? (ල: 02)

05. a. විද්‍යුත් සමර්පණ සම්බන්ධයෙන් පහත වගන්ති වල හිස්තැන් පුරවන්න.
   - i. Microsoft PowerPoint මගින් කදා දර්ශනයක් (Slide Show) දැක බලා ගැනීම සඳහා ……… යතුර භාවිතා කළ යුතුය.
   - ii. කදා දැක්මක් (Slide Show) තුළ දී යතුරු පුවරුවේ .................. අකුර තද කිරීම මගින් සම්පූර්ණ තිරය සුදු පැහැ ගැන්වේ.
   - iii. විද්‍යුත් සමර්පණ මෘදුකාංග සඳහා උදාහරණයක් ලෙස............... මෘදුකාංගය දැක්විය හැක (ලකුණු 03)

b. සාර්ථක ඉදිරිපත් කිරීමක අඩංගු විය යුතු ලක්ෂණ දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)


c. MS PowerPoint මෘදුකාංගයෙහි දසුන් තීරුවෙහි ඇති නිරූපක කිහිපයක් පහත දක්වා ඇත. එහි A, B, C හා D ලෙස නම් කර ඇති නිරූපකවල නම් වරහන් තුළින් තෝරා ලියන්න.
**(කදා දැක්ම දසුන , සාමාන්‍ය දසුන , කියවීම් දසුන , කදා සුබෙදුම් දසුන)** (ලකුණු 02)




d. පහත දැක්වෙන්නේ ප්‍රදර්ශකයක් නිර්මාණයට භාවිතා කළ හැකි කදා කිහිපයකි. පළමු රූපයේ දැක්වෙන කදාවේ පෙනුම දෙවන රූපයේ දැක්වෙන ආකාරයට මාරු කිරීම සඳහා භාවතා කළ හැකි සමර්පණ මෘදුකාංගයක ඇති පහසුකම කුමක්ද? (ලකුණු 01)




රූපය 01




රූපය 02 රූපය 03

e. ප්‍රදර්ශකයක් නිර්මාණයේදී කදාවන් මතට ඇතුළත් කළ හැකි බහු මාධ්‍ය මෙවලම් 04 ක් ලියන්න.(ල. 04)

**දෙවන වාර පරීක්ෂණය - 2019**

**සාමාන්‍ය තොරතුරු තාක්ෂණය -12 ශ්‍රේණිය**

**1** පත්‍රය පිළිතුරු

**පිළිතුරු පත්‍රය - 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 11 | 2 | 21 | 2 | 31 | 3 |
| 02 | 1 | 12 | 1 | 22 | 4 | 32 | 4 |
| 03 | 1 | 13 | 4 | 23 | 1 | 33 | 1 |
| 04 | 3 | 14 | 4 | 24 | 2 | 34 | 4 |
| 05 | 2 | 15 | 2 | 25 | 1 | 35 | 3 |
| 06 | 3 | 16 | 2 | 26 | 1 | 36 | 2 |
| 07 | 1 | 17 | 2 | 27 | 4 | 37 | 2 |
| 08 | 2 | 18 | 4 | 28 | 4 | 38 | 3 |
| 09 | 4 | 19 | 3 | 29 | 3 | 39 | 3 |
| 10 | 2 | 20 | 1 | 30 | 2 | 40 | 4 |

(ලකුණු 40)

**පිළිතුරු පත්‍රය - 2 කොටස**

| | | | ලකුණු |
|---|---|---|---|
| 01 | a | ගොනු නාමය - Student ගොනු දිගුව - .docx | 02 |
| | b | MS Word | **02** |
| | c | ගොනුව තේරීම. Cut විධානය ලබා දීම. Computer හි D: ධාවකය විවෘත කර New Folder මෙවලම භාවිතයෙන් ගොනු බහාලුමක් නිර්මාණය කර My School ලෙස නම් කිරීම. එය විවෘත කර Paste ලබා දීම. | 02 |
| | d | උපාංග ධාවක (Drivers)<br>ප්‍රතිවෛරස මෘදුකාංග<br>තැටි ආකෘතිකරණය<br>තැටි සුපරීක්ෂණය | 02 |
| | e | විධාන පේළිඅතුරුමුහුණත (CLI)<br>චිත්‍රක පරිශීලක අතුරුමුහුණත (GUI) | 02 |
| | f | සුදුසු නිවැරදි පිළිතුරු එකක් සඳහා | 02 |
| | | **මුලු ලකුණු** | 12 |
| 02 | a | i. Font type, Font Size, Underline<br>ii. Bullets<br>iii. Center<br>iv. අක්ෂර වින්‍යාසය වැරදි වීම. Spelling and Grammar<br>V Hyperlink | 05 |
| | b | i.) UNDO - අවසන් වරට සිදු කළ කායර්ය අවලංගු කිරීම<br>ii.) COPY - පාය කොටසක් පිටපත් කිරීම<br>iii.) FIND - ලේඛණයක පාඨයක් සෙවීම<br>iv.) SORT - ලැයිස්තුවක් අනුපිළිවෙළින් සැකසීම<br>v.) CHANGE CASE - අක්ෂර වල Capital, Simple මාරු කිරීම | 05 |

| | | | |
|---|---|---|---|
| | | | |
| | c | i.) Ctrl + P - මුද්‍රණය කිරීම<br>**ii.)** Ctrl + N - නව ලේඛණයක් ලබා ගැනීම. | 02 |
| | | **මුලු ලකුණු** | **12** |
| **03** | **i** | Wrap Text | 01 |
| | **ii** | =B9 * B$3 හෝ = B9 * $B$3 | 02 |
| | **iii** | C9 කෝෂය තේරීම. දකුණු කෙළවරේ කොනේ ලැබෙන පිරවුම් හැඩලයෙන් C14 දක්වා ඇදගෙන යාම. හෝ<br><br>C9 තේරීම. Copy මෙවලම මත Click කිරීම. C10 සිට C14 දක්වා කෝෂ පරාසය තේරීම. Paste මෙවලම මත click කිරීම | 02 |
| | **iv** | =Sum(E9 : E14) | 01 |
| | **v** | =max(C9 : C14) | 02 |
| | **vi** | =min(G9 : G14) | 02 |
| | **vii** | =average (C9:C14 , E9 : E14 , G9 : G14) | 02 |
| | | **මුලු ලකුණු** | **12** |
| **04** | **i** | පොත් වගුව - Book_ID<br>ශිෂ්‍ය වගුව - St_ID | 02 |
| | **ii** | බැහැර ගෙන යාම් වගුව - St_ID<br>බැහැර ගෙන යාම් වගුව - Book_ID | 02 |
| | **iii** | a) ශිෂ්‍ය වගුව , බැහැර ගෙන යාම් වගුව | 02 |
| | | b) ශිෂ්‍ය වගුව - S04 \| Sewwandi \| 8<br>බැහැර ගෙන යාම් වගුව - S04 \| 3405\| 2020/02/18 \| | 04 |
| | **iv** | විමසුමක් (Query) | 02 |
| | | **මුලු ලකුණු** | **12** |
| **05** | **a** | i) F5<br>ii) W<br>**iii)** MS PowerPoint/Open Office Impress | 03 |
| | **b** | අවශ්‍ය තොරතුරු සන්නිවේදනය කිරීමේ හැකියාව පැවතිය යුතුය.<br>ඒ සඳහා ගැලපෙන රූප සටහන්, ශ්‍රව්‍ය/දෘෂ්‍ය යොදාගෙන තිබීම.<br>ප්‍රේක්ෂක අවධානය නොනැසෙන ලෙස සැකසිය යුතුය | 02 |
| | **c** | සාමාන්‍ය දසුන<br>කදා සුබෙදුම් දසුන<br>කියවීම් දසුන<br>කදා දැක්ම දසුන | 04 |
| | **d** | කදා පිරිවැසුම (Slide Layout) | 01 |
| | **e** | පින්තූර , සජීවන, ශ්‍රව්‍ය ගොනු , දෘෂ්‍ය ගොනු | 02 |
| | | **මුලු ලකුණු** | **12** |